

# මිහිමඬලේ නවාතැන

කොතෙක් වේලා බලා සිටිය ද ඇසට වෙහෙසකර නොවෙන වස්තූන් පිළිබඳ ලැයිස්තුවක් අපේ අත්තම්මලා වෙත වූහ. අලියා අහස මුහුද දරුවා ඒ අතර වූ නෙත් පිනන රසඳුන්ය. සොබාදහම ජීවිතය සමඟ බද්ධ කරගත් ඔවුහු දියදම් මාතාව ගේ අපූර්ව නිර්මාණ තුළින් චිත්ත සංතෘප්තිය උපයාගත්හ.

විද්‍යුත් සන්නිවේදන මඟින් ලෝකය විශ්ව ගම්මානයක් බවට පත් වුවද ස්වභාව ධර්මය පිළිබඳ සංවේදී වූවන්ට අදත් මේ සතුට උපයා ගත හැකිය. එකම ගැටලුවකට ඇත්තේ ඇස දිසෙන මානයේ නිලත් - කොලත් නොමැති වීම පමණී.

මේ මිහිමඬල තුළ ඉඳහිට හෝ එවන් රසඳුනක සේයාවක් ඉතිරිව ඇත.දීපංකර් ඇරොන් නම් වූ පරිසර සංවේදී මිනිසා සිය ජීවමාන අත්දැකීම් India Poespectire සඟරාව වෙනුවෙන් ප්‍රතිනිර්මාණය කළේ මේ නිසාම ය.

තුරු ලතා මල් පලතුරු වලින් සුසැදි කොබෙට් (Corbett) ජාතික උද්‍යානය තවමත් මිනිස් නෙත සිත බඳන පරිසරකාමීන්ට නවාතැනකි. මෙහි නවාතැන් ගැනීමට සුදුසුම කාලය අප්‍රේල් සිට මැයි අතර කාල සීමාවයි.

මේ කාල සීමාවේ දී තණ පඳුරු මිටිව ඇති අතර සිව්පා සත්තු වනාන්තර අභ්‍යන්තරයේ සිට ගං ඇල දොල වෙත ඇදෙති.

මෙම අවස්ථාවන්හි දී ඇකී මැකී දිවෙන සත්ත්ව රූප නොව රිසි සේ සත්ත්ව ගති රටා අධ්‍යයනය කළ හැකිය.

කොබට් ජාතික උද්‍යානයේ හරය ලෙස සලකන දයිකලා ප්‍රදේශයට පැමිණි දීපංකර් ගේ දෙනෙත නිල්තැනිතලාවක නතර විය. 'Cbaur'නම් වූ මෙම තණ බිම "රම්ගන්ගා" නදිය ආසන්නයේ පිහිටියේය.

මෙහි අසිරි සිත් සේ විඳ ගනු පිණිස ඔහු 'Cbaur'තෘණ භූමිය සමීපව පිහිටි Macban තානායමට ගියේය. අඳුර පැමිණෙමින් තිබිණි. වන පියසේ කෙලි දෙලෙන් සිටින සුරතල් සතුන්ට ඔහු ඉව ඇල්ලී ය. ඉන් අනතුරුව ඔහු උද්‍යානයේ නිදහසේ කරක් ගැසුවේය. වනාන්තරයේ සිට ඇදී එන අලි රංචුවකි. ඔවුන් මේ ඇදෙන්නේ සිය පිපාසය සංසිඳුවා ගැනීමට ය. හැම හැන්දෑවක ම මේ අන්දමට එන අලි රංචුව Cbaur ප්‍රදේශයෙන් ආහාර උපයා එහි ම රාත්‍රිය ගෙවා උදාවන හිරු රැසින් මිදීමට යළිත් වනයට ගමනාරම්භ කරති.

අලි රංචුවෙන් දළ ඇති උන් හුදෙකලාව සිටින අතර ඔවුන් ගේ දළ ඉතා හොඳින් වැඩී ඇත. කොබෙට් වන උද්‍යානයේ දී අලියන් ගේ දැක්ම සරල දසුනක් නොවේ. දිය නෑමට පමණක් නොව මඩ නෑමට ද අලියන් දක්වනුයේ දැඩි ප්‍රියමනාපතාවකි.

මෙම පරිසර ගවේෂණයේ දී ඔහු ගේ සිත ඉතා තදින් අකාර්ශනය වූයේ තිත් මුව රංචු වෙතට ය. ලිංගික උත්තේජන කාලසීමාවේ දී මෙම මුව රංචු ගැවසීම සුලබ දසුනකි.

පිරිමි මුවන් ගේ අං තට්ටුව සිය සහකාරිය ගේ ආකර්ශනයටත් සතුරන් පරදවා ජය ලබා ගැනීමේ අභිමානයේත් සංකේතයකි. නිදහසේ හැසිරෙමින් සිය ආශාවන් සපුරා ගැනීම ද තිත් මුවන් ගේ සිරිතකි. එක් දිනක උදයේ මුව ජෝඩුවක් කවටකමට මෙන් නිදහසේ හැසිරෙමින් ක්‍රීඩාවක නිතර වූ අතර රංචුවේ සෙස්සෝ එය අනුකරණය කරමින් එතැන සිට ම බලා සිටියහ. ඔහු දයිකලා සිට සම්බාර් Sammbbar මාවතට පැමිණියේය. "සම්බාර් දැකුම" යන අදහසින් මෙම වචනය බිඳී ඇත. සබ්බාර් විශේෂය තිත් මුවන්ට වඩා විශාලය. මෙම සබ්බාර් රංචුවක වැඩි වශයෙන් සිටින සාමාජිකයන් ගණන 2 කි. එය විටෙක 3 හෝ 4 ක් ද වෙයි. මෙම තෘණ බිම් කලාපයේ දී Hog Shaped මුවන් සහ Barking මුවන් වැනි විශේෂ දැක ගත හැකි බව ඔහු සඳහන් කරයි.

මෙම උද්‍යානය කුරුලු විමනකි. Long Pallas Fishing Eagle වැනි කුරුල්ලෝ තුරු මත ලැගුම් ගනිති. ලිංගික උත්තේජනය නිසා මැග්පි රොබින් Magpie Robin කුරුල්ලන්ගේ පරිසරය ගීතවත් වෙයි. Pied Bushcharts, Crockal, Red Whiskered Bulbus, Pied Kingfisher, මෙහි සිටින විශේෂිත කුරුලු මිතුරන් ය. වළිකුකුලන් ඉතා දර්ශනීය වූවද දීපංකර් ගේ කැමරාවට හසුකර ගැනීමට ඔහු අපොහොසත් වූවේය.

කිඹුල් තිප්පොළ සමීපයේ නතර වූ දීපංකර් ට කිඹුලන් සහ gbarials විශේෂ දැක ගත හැකි විය. සිහින් වූද දිගු සිරුරු ඇති gbarials විශේෂයන් ගේ හොම්බ මසුන් දඩයමට ආධාර වෙයි. මොවුන් ගේ ගහණය ඉතා සීමිත ය.පඳුරු යට සැඟවී සිටින ව්‍යාඝ්‍රයන් ගේ මුහුණ පමණක් විටෙක දිස් වූ බව දීපංකර් සඳහන් කරයි. ඝන පඳුරු ව්‍යාඝ්‍ර මුහුණ පැහැදිලිව නො පෙනෙන සේ වැසී ඇත. වනයේ නවාතැන ලෙස සලකන (Corbett) කොබෙට් ජාතික උද්‍යානය කුරුලු උරග / ක්ෂීරපායී / උභය ජීවී/ විශේෂයන් ගෙන් පමණක් නොව තුරුලතා, මල් පලතුරු වලින් ද ගහණය . සතුන් ගේ සෙල්ලම් මිහිරි වූ කුරුලු නාද, මල් පලතුරු සුවඳ රැළි වනයේ මේ අපූරු නවාතැන මිහි මව විසින් ලබා දුන් දායාදයකි.

අලි රංචුවෙන් දළ ඇති උන් හුදෙකලාව සිටින අතර ඔවුන් ගේ දළ ඉතා හොඳින් වැඩී ඇත. කොබෙට් වන උද්‍යානයේ දී අලියන් ගේ දැක්ම සරල දසුනක් නොවේ. දිය නෑමට පමණක් නොව මඩ නෑමට ද අලියන් දක්වනුයේ දැඩි ප්‍රියමනාපතාවකි. මෙම පරිසර ගවේෂණයේ දී ඔහු ගේ සිත ඉතා තදින් අකාර්ශනය වූයේ තිත් මුව රංචු වෙතට ය.

**පූනයා චාන්දනි ද සිල්වා**



